www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ සමග එක්වන්න!

## Join the International Students for Social Equality!

**සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ව්‍යාපාරයේ ප්‍රකාශය**
**2007 අගෝස්තු 30**

යුද්ධයට හා අසමානතාවට එරෙහිව අරගල කරන ලෙස ලොව පුරා සිටින ශිෂ්‍යයන් වෙත සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) කැඳවුම් කර සිටියි. සසජාශි සමග එක්වන්න! කම්කරුවන්ගේ සහ ශිෂ්‍ය තරුනයන්ගේ ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනගන්න!

ගෝලීය දේශපාලන හා ආර්ථික අර්බුදයේ අත්‍යසාමාන්‍ය තීව්‍රවීමක් මධ්‍යයේ එක්සත් ජනපදයේ ද අනෙකුත් රටවල ද ශිෂ්‍යයෝ යලි තම අධ්‍යයන කටයුතුවලට පැමිනෙති.

ඇමරිකානු ජනතාව තුල ඉරාක යුද්ධය අවසන් කිරීමට පවතින කැමැත්ත පැහැදිලිව ප්‍රකාශයට පත් වූ එක්සත් ජනපද අන්තර් වාර මැතිවරනයෙන් වසරකට පසුව ද එම යුද්ධය ඇදීගෙන යයි. ඉරාකය ආක්‍රමනය කිරීම හේතු කොට ගෙන එරට වැසියන් සියදහස් ගනනක් ඝාතනය වී තවත් මිලියන ගනනක් සරනාගතයන් බවට පත් කෙරී ඇති අතර එක්සත් ජනපදයේ හා ආක්‍රමනයට හවුල් වූ අනෙකුත් රටවල සොල්දාදුවන් 4,000කට වැඩි ප්‍රමානයක් මිය ගොස් ඇත. මේ සියල්ල සිදුව ඇත්තේ සම්පත් ගහන හා භූ මූලෝපායික ලෙස තීරනාත්මක මැද පෙරදිග කලාපය පාලනය කිරීමට ඇමරිකානු පාලක ප්‍රභුවට පවත්නා අධිෂ්ඨානය හේතුවෙනි.

තවද නව ආක්‍රමනයන් සූදානම් කරනු ලැබෙමින් පවතී. ඉරාක ආක්‍රමනයට පෙරාතුව නරුම ආකාරයෙන් භාවිතයේ යෙදවූ බොරු සහ ප්‍රකෝපකාරිත්වයන් දැන් ඉරානයට එරෙහිව ඒ අයුරින් ම පුනරුච්චාරනය කරනු ලැබේ. ඉරානයට එරෙහිව ගනු ලබන මිලිටරි ක්‍රියා මාර්ගයක් සිතා ගැනීමට පවා නොහැකි ප්‍රතිවිපාක අත් කර දෙන්නා වූ ගෝලීය යුද ගින්නක් එක්සත් ජනපදයත් රුසියාව, චීනය හෝ යුරෝපීය බලයන් අතර පහසුවෙන් ම අවුලුවාලීම හැකි කරයි. බුෂ්ගේ ම වචනවලින් කියතොත් ඉරාක යුද්ධය වනාහී "21 වන සියවසේ යුද්ධවල" ප්‍රථම එක පමනි.

ඩිමොක්‍රැටික් පක්ෂයේ ඊනියා විරුද්ධත්වය කාලකන්නි ප්‍රෝඩාවකට වැඩි යමක් නො වන බව එමගින් ම තහවුරු කෙරී ඇත. ඩිමොක්‍රැටිකයන්ව කොංග්‍රසයේ බලයට පත් කල 2006 අන්තර්වාර මැතිවරනයේ සැබෑ ප්‍රතිඵලය වන්නේ යුද්ධය දිගටම කෙරීගෙන යමින් මහජන මතය වියැකී යන ආකාරයේ කාලය කාදමීමයි. ඉරාක යුද්ධයට අවශ්‍ය ප්‍රතිපාදන සඳහා යලියලිත් ඡන්දය පාවිච්චි කොට ඇති ඩිමොක්‍රැටිකයන් ඉරානයට එරෙහි මිලිටරි ක්‍රියාමාර්ගයට ද සහයෝගය දෙනු ඇත.

මිලිටරි කෙටුම්පතක් හඳුන්වා දීමට අවශ්‍ය සූදානම් වීම් මැනැවින් කරගෙන යනු ලැබේ. අවසාන වසයෙන් ඇමරිකානු තරුනයන් යුද බිලි ලෙස සේවයේ යෙදීමට බලහත්කාරය යෙදීමටත් මිලිටරි බලකායන්ගේ ක්ෂයවී යන ධූරාවලීන්ට මුක්කු ගැසීමටත් ක්‍රමයක් සොයා ගන්නේ නැතිව ඇමරිකානු පාලක ප්‍රභූවේ අධිරාජ්‍යවාදී අභිමතාර්ථයන් තෘප්තිමත් කර ගත නොහැකි ය.

වැඩෙන ආර්ථික අර්බුදය මිලියන ගනන් ජනයා මත ප්‍රගාඪ ලෙස බලපායි. බැංකු හා කෝටිපතියන් මුදාගැනීමට ආන්ඩු පොරවදින නමුත් ආර්ථික පරිහානියේ පීඩනයට මුහුන දෙන අය වෙනුවෙන් කිසිවක් නො කෙරේ. නිවාස අහිමිවෙමින් සිටින පවුල් අහස උසට නගින උකස් බර යටතේ බංකොලොත්වීමට මුහුනපා සිටී. ශිෂ්‍යයෝම ද වැඩෙන අධ්‍යාපන වියදම්වලින් මිරිකී සිටිති. නවතම සංඛ්‍යා ලේඛන දත්ත මගින් පිරිහෙන ආදායම් හා වැඩෙන අසමානතාව පෙන්වා දෙයි. මිලියන ගනන් ජනයාට රැකියා අහිමි කරනු ඇත්තා වූ ජාත්‍යන්තර නය අර්බුදයක හා අවපාතයක තර්ජනය තථ්‍ය වසයෙන් ම යථාර්ථයකි.

සමාජ අසමානතාව හා සමාජ ප්‍රතිසතිතාවන් වැඩෙන තතු යටතේ එක්සත් ජනපද ආන්ඩුව අතිමූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් දැඩි ලෙස බාදනය කොට ඇත. ඔත්තු බැලීමේ වැඩ සටහන්වල පෙර නුවූ විරූ ප්‍රසාරනය, ජනාධිපතිවරයා අත අබාධිත බලතල තබා

ගැනීමට සහ දේශපාලන අදහස් දැරීම අපරාධයක් ලෙස හැඳින්වීමට ඇති ප්‍රවනතාව ආදිය පෙන්වා දෙන්නේ දැනටමත් එක්සත් ජනපදයේ ආඥාදායකත්වයකට හා මහජන මර්දනයට අවශ්‍ය පදනම් දමා ඇති බවයි.

සසජාශි පදනම් වන්නේ සමාජවාදී ඉදිරි දර්ශනයක පදනම මත කම්කරුවන්, ශිෂ්‍යයන් හා තරුනයන්ගේ ජාත්‍යන්තර පරිමාන එක්සත් භාවය සඳහා කරන දෘඪතර අරගලයක් මතයි. අපි සියලු වර්ගවල ජාතික ස්වෝත්තමවාදයන්වලට විරුද්ධ වන්නෙමු. විසිවන සියවස තුල තරගකාරී ජාතික රාජ්‍යයන් සහ ඒවායේ පාලක ප්‍රභූන්ගේ අවශ්‍යතා රැකීමට දියත් කරන ලද යුද්ධවල දී මිලියන සිය ගනනක් දෙනා මරා දැමුනි. දැන් යලිත් එම ආකෘතිය පුනර්කරනය වෙමින් තිබේ.

කිසිදු රටක පවත්නා දේශපාලන සංස්ථාපිතයේ කිසිදු කොටසක් යුද්ධය අවසන් නො කරනු ඇත. අද දින යුද්ධ අවසන් කල හැක්කේ ද හෙට දින යුද්ධවල තර්ජනය වැලැක්විය හැක්කේ ද මහජනතාවගේ ස්වාධීන මැදිහත්වීම හරහා ම පමනි. සරත් කාලය සඳහා පාසල් විවෘත කිරීමට යන මොහොතේ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සමග දේශපාලනිකව සහයෝගී සමාජවාදී සමානතා පක්ෂයේ ශිෂ්‍ය සංවිධානය වන සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ව්‍යාපාරය එක්සත් ජනපදයේ ද ලෝකය පුරා ද ශිෂ්‍යයන් වෙත එයට බැඳෙන ලෙසත් තමන්ගේ පාසල් හෝ උසස් පාඨශාලාවල එහි ශාඛා ගොඩනගන ලෙසත් කැඳවුම් කර සිටී.

තරුන තරුනියනි, ශිෂ්‍යයිනි, අනාගතය අපගේ ය. එහෙත් අප ඒ සඳහා අරගල කල යුතු ය! සමාජවාදය සඳහා අරගලයට එක්වනු! සසජාශි සමග එක්වනු!

සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ව්‍යාපාරයේ මූලික ලේඛන කියවන්න.

සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ සමග එක්වනු!

ඔබගේ පාසලේ, උසස් පාඨශාලාවේ සසජාශි ශාඛා ගොඩනගනු!

සසජාශි/ සසප යුද්ධයට එරෙහි හදිසි සම්මේලනයේ දී සම්මත කල යෝජනාව

ඉරාක යුද්ධය අවසන් කරනු! ඉරානයට එරෙහි යුද එලැඹුම නතර කරනු! යුද්ධයට එරෙහි ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනගනු!

© www.wsws.org